10 | S | I

ද මැසිනොද් විද්‍යාලය කඳාන

**De Mazenod College - Kandana**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 13 ශ්‍රේණිය

2016 පෙබරවාරි පරීක්ෂණය

2016 A/L

25/02/2016

# සංයුක්ත ගණිතය I
# Combined Mathematics I

කාලය පැය 3

- A කොටසේ සියලුම ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- B කොටසේ ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

Learning Resource Center R De Mazenod College Kandana

## A කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. සියලු ධන නිඛිල සඳහා $\frac{1}{1.3}+\frac{1}{3.5}+\frac{1}{5.7}+.......+\frac{1}{(2n-1)(2n+1)}=\frac{n}{2n+1}$ බව ගණිත අභ්‍යුහන මූල ධර්මයෙන් සාධනය කරන්න.

02. $\frac{(x+2)(3-x)}{(x+1)(x^2+1)}\leq 0$ අසමානතාවය සපුරාලන $x$ හි අගය පරාසය සොයන්න.

(දෙවෙනි පිටුව බලන්න)

03. පිරිමි ළමුන් 7 ක් හා ගැහැණු ළමුන් 5 ක ගෙන් දෙවර්ගයම නියෝජනය වන පරිදි 4 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සාදා ගත හැකි ක්‍රම ගණන 455 බව පෙන්වන්න.

04. $\left(\sqrt{x}-\dfrac{k}{x^2}\right)^{10}$ ප්‍රසාරණයේ $x$ ගෙන් ස්වායත්ත පදයය 405 වේ. $k$ හි අගය $\pm 3$ බව පෙන්වන්න.

5. $\lim\limits_{x\to 3}\dfrac{\sqrt{x^2+7}-4}{x^5-243}=\dfrac{1}{540}$ බව පෙන්වන්න.

(තුන්වෙනි පිටුව බලන්න)

6. $\frac{d}{dx}(x - Sin\ x\ Cos\ x) = 2\ Sin^2 x$ බව සාධනය කරන්න. එනයින් $\int_0^{\pi/2} Sin^2 x\ dx = \frac{\pi}{4}$ බව සාධනය කරන්න.

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

07. $ABC$ ත්‍රිකෝණයක ශීර්ෂ වල ඛණ්ඩාංක පිළිවෙළින් (5, 2) , (2 , 3) හා (6 , 5) වේ. මෙය සම ද්විපාද ත්‍රිකෝණයක් බව පෙන්වන්න. එනයින් $\hat{A}$ යේ අභ්‍යන්තර කෝණ සමච්ඡේදකයේ සමීකරණය සොයන්න.

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

08. $x^2 + y^2 = r^2$ වෘත්තය මඟින් $x^2 + y^2 + 2x - 4y + 1 = 0$ වෘත්තයේ පරිධිය සමච්ඡේදනය කරයි නම් $r = 3$ බව සාධනය කරන්න. එම අගයට අනුරූප පොදු ජ්‍යායේ සමීකරණය සොයා එයට පළමු වෘත්තයේ කේන්ද්‍රයේ සිට ඇති ලම්බ දුර සොයන්න.

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

(සතරවෙනි පිටුව බලන්න)

09. $y_1 = \left| Sin\ x \right|$ සහ $y_2 = Co\ x$ ශ්‍රිත $0 \le x \le 2\pi$ සඳහා ප්‍රස්ථාර එකම සටහනක ඇඳ එනයින් $\left| Sin\ x \right| = Cox\ x$ වන විසඳුම් ලියන්න.

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

10. $Tan^{-1}\left(\frac{1}{2}\right) + Tan^{-1}\left(\frac{1}{3}\right) = Tan^{-1}\frac{1}{4} + Tan^{-1}\left(\frac{3}{5}\right)$ බව සාධනය කරන්න.

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

Roy Dissanayake B.Sc. (Dip. in Ed.)

| 10 | S | I |
|---|---|---|

ද මැසිනොද් විද්‍යාලය කඳාන
**De Mazenod College - Kandana**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 13 ශ්‍රේණිය
2016 පෙබරවාරි පරීක්ෂණය

25.02.2016

# සංයුක්ත ගණිතය I
# Combined Mathematics I

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## B කොටස

(11) (a) $f(x)=(4-k)x^2+(2k+4)x+(8k+1)$ වේ. මෙහි $K\in\Re$

(i) $f(x)=0$ සමීකරණයට තාත්වික ප්‍රභින්න මූල දෙකක් තිබීමට $K$ ට ගත හැකි අගයන් කුලකය සොයන්න.

(ii) $K=2$ විට සියලුම තාත්වික $x$ සඳහා $f(x)$ ධන බව පෙන්වා එවිට $f(x)$ ට ගතහැකි අඩුතම අගයත් අඩුතම අගය ලැබෙන $x$ හි අගයත් සොයන්න.

(b) $g(x)\equiv x^4+ax^3+bx^2-3x-2$ බහු පදයෙහි $(x-2)$ සහ $(x+1)$ සාධක වේ. $a$ හා $b$ සොයන්න. ඉතිරි වර්ගජ සාධකය $(x^2+x+1)$ බව පෙන්වා එනයින් $g(x)>0$ වන $x$ හි පරාසය ලියන්න.

(c) $\log_a b=\dfrac{\log_c b}{\log_c a}$ බව පෙන්වන්න.

$\log_{25}x^2+(\log_5 x)^2<2$ නම් එවිට $\dfrac{1}{25}<x<5$ බව සාධනය කරන්න.

---

(12) (a) $\dfrac{r}{(r+1)(r+2)}=\dfrac{A}{r+1}+\dfrac{B}{r+2}$ වන පරිදි A හා B නියත සොයන්න.

$\dfrac{2.1}{2.3}+\dfrac{2^2.2}{3.4}+\dfrac{2^3.3}{4.5}+..........$ ශ්‍රේණියේ $r$ වන පදය $u_r$ ලියන්න.

$u_r=f(r)-f(r-1)$ වන පරිදි $f(r)$ ශ්‍රිතයක් සොයන්න.

එමඟින් $\sum_{r=1}^{n}u_r$ අගයන්න.

(b) $y = x^2 - 4$ හි දළ ප්‍රස්ථාරයක් අඳින්න.

එනයින්,

$y = \left| x^2 - 4 \right|$ ප්‍රස්ථාරය වෙනම සටහනක අඳින්න.

$\left| x^2 - 4 \right| \geq 3$ අසමානතාවය තෘප්ත කරන $x$ හි පරාසයන් සොයන්න.

(c) U T H T H A R A යන වචනයේ වරකට අකුරු 4 බැගින් ගෙන පිළියෙල කර ගතහැකි සංකරණ ගණන සහ සංයෝජක ගණන සොයන්න.

---

(13) (a) $x = 2\cos t - \cos 2t$ සහ $y = 2\sin t - \sin 2t$ මගින් වක්‍රයක ඕනෑම ලක්ෂයක ඛණ්ඩාංක පරාමිතිකව දැක්වේ.

$t = \pi/2$ වන විට $\dfrac{dy}{dx} = -1$ බව පෙන්වා එම අගයට අනුරූප වක්‍රයට ඇඳි ස්පර්ශකයේ සමීකරණය සොයන්න.

(b) අඩ සිරස් කෝණය $30^0$ වූ කුහර කේතුවක හැඩය ඇති බඳුනක් එහි ශීර්ෂය යටි අතට තබා අක්ෂය සිරස්ව ඇත. $3\ cm^3 s^{-1}$ සීග්‍රතාවෙන් බඳුනට ජලය වත් කරනු ලැබේ. බඳුනේ ජල මට්ටම $6cm$ විට

(i) ජල මට්ටම ඉහළ නගින සීග්‍රතාව $\dfrac{1}{4\pi} cms^{-1}$ බවද,

(ii) ජලය ස්පර්ශ වන මතුපිට පෘෂ්ඨ කොටසේ වර්ගඵලය වැඩිවෙමින් ඇති සීඝ්‍රතාවයද සොයන්න.

(c) $y = \dfrac{1}{(x-1)(x-2)}$ නම් $\dfrac{dy}{dx}$ සොයා එනයින් $(3/2, -4)$ ලක්ෂය $y$ ශ්‍රිතයේ උපරිමයක් බව සාධනය කර ස්පර්ශෝන්මුඛ රේඛා දක්වමින් ශ්‍රිතයේ දළ සටහනක් අඳින්න.

එනයින්,

$K(x-1)(x-2) - 1 = 0$ සමීකරණයට විසඳුමක් නොමැති වීමට $K$ හි අගය පරාසය ලියන්න.

(14) (a) $\int_2^3 \frac{3x-2}{x^3-x^2}dx = \ln(4/3) + \frac{1}{3}$ බව පෙන්වන්න.

(b) $\frac{\cos^2 x}{2+\sin x} = A + B \sin x + \frac{c}{(2+\sin x)}$ වන පරිදි A, B, C, නියත සොයන්න.

එනයින් $\int_0^{\pi/2} \frac{\cos^2 x}{2+\sin x}dx$ සොයන්න.

(c) ඉහත ප්‍රතිඵල ඇසුරින් සහ කොටස් වශයෙන් අනුකලනය ක්‍රමය යොදා ගනිමින්,

$\int_0^{\pi/2} \sin x \ \ln(2+\sin x)dx = \ln 2 + \pi(1-\frac{1}{\sqrt{3}}) - 1$ බව සාධනය කරන්න.

---

(15) (a) $ax + by + c = 0$ රේඛාව මත $(h_1, k_1)$ ලක්ෂයෙහි ප්‍රතිබිම්බය $(h_2, k_2)$ නම් එවිට,

$$a(h_1+h_2) + b(k_1+k_2) = -2c$$ සහ

$$b(h_1-h_2) - a(k_1+k_2) = 0$$ බව පෙන්වන්න.

(b) $A\,B\,C\,D$ රොම්බසයකි. එහි $A\,C$ විකර්ණය $2x-y-3=0$ රේඛාව මත පිහිටි අතර $A$ හා $B$ හි ඛණ්ඩාංක පිළිවෙලින් ( 2 , 1 ) සහ ( 6 , 4 ) වේ.

(i) BD සමීකරණය

(ii) C හා D හි ඛණ්ඩාංක

(iii) A B C D රොම්බසයේ වර්ගඵලය යන මේවා සොයන්න.

(16) (a) $x^2+y^2+2x+6y+1=0$ යන වෘත්තය ප්‍රලම්බව ඡේදනය කරන කේන්ද්‍රය මූල ලක්ෂය වූ වෘත්තයේ සමීකරණය $x^2+y^2=1$ බව පෙන්වන්න.

තවද, $x^2+y^2=1$ වෘත්තයේ පරිධිය සමච්ඡේදනය කරමින් ( 2 , 0 ) හරහා යන එසේම $x^2+y^2-4y-5=0$ වෘත්තය ප්‍රලම්බව ඡේදනය කරන වෘත්තයේ සමීකරණය $2x^2+2y^2-3x+6y-2=0$ බව පෙන්වන්න.

(b) $x^2+y^2+2x-8=0$ වෘත්තයේත් $x+y-1=0$ සරල රේඛාවෙත් ඡේදන ලක්ෂයන් හරහා ඇඳි ඕනෑම වෘත්තයක සමීකරණය ලියන්න.

එම වෘත්ත අතුරින් කේන්ද්‍රය $2x+y+1=0$ රේඛාව මත පිහිටන වෘත්තයේ සමීකරණය $x^2+y^2+4x+2y-10=0$ බව පෙන්වන්න.

---

(17) (a) ඕනෑම ත්‍රිකෝණයක් සඳහා *sin* නියමය ප්‍රකාශ කරන්න.

ABC ත්‍රිකෝණයක් සඳහා $\left(\frac{a-b}{a+b}\right)Cot\left(\frac{c}{2}\right)=Tan\left(\frac{A-B}{2}\right)$ බව පෙන්වන්න.

ත්‍රිකෝණයක පාද 2 ක දිග $(\sqrt{3}+1)$ හා $(\sqrt{3}-1)$ වන අතර ඒවා අතර කෝණය $60^0$ වේ. ඉහත ප්‍රතිඵල භාවිතයෙන් ත්‍රිකෝණයේ ඉතිරි කෝණවල අගයන් හා ඉතිරි පාදයේ දිග සොයන්න.

(b) $Tan\left(\pi/_4+\frac{x}{2}\right)=\sec\ x+Tan\ x$ බව පෙන්වන්න.

එනයින් $Tan\pi/_{12}=(2-\sqrt{3})$ බව අපෝහනය කරන්න.

(c) $f(\theta)=4\ \sin\ \theta-3\ Cos\ \theta+1$ ලෙස දී ඇත. $\frac{1}{f(\theta)}$ හි උපරිම අගය හා අවම අගය සොයන්න.

Roy Dissanayake (B.Sc., Dip. In Edu.)

ද මැසිනොද් විදුහල කඳන

**De Mazenod College - Kandana**

| 10 | S | II |
|---|---|---|

2016 A/L

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 13 ශ්‍රේණිය**

2016 පෙබරවාරි පරීක්ෂණය

25/02/2016

# සංයුක්ත ගණිතය II
# Combined Mathematics II

කාලය පැය 03

**A කොටසේ ප්‍රශ්න සියල්ලටම සහ B කොටසින් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

Learning Resource Center
De Mazenod College
Kandana

## A කොටස

01. පොළොව මත පිහිටි $O$ ලක්ෂයකට සිරස්ව ඉහළින් පිහිටි $P$ ලක්ෂයකින් අංශුවක් තිරස්ව $u$ ප්‍රවේගයෙන් ප්‍රක්ෂේප කෙරේ. අංශුව $O$ සිට $d$ තිරස් දුරකින් $Q$ ලක්ෂයක දී බිම වැදී.
(i) OP දුර සොයා (ii) $Q$ හිදී අංශුවේ ප්‍රවේගයේ විශාලත්වය සොයා එහි දිශාව තිරසට $\hat{\alpha}$ නම් $Tan\ \alpha = \dfrac{gd}{u^2}$ බව පෙන්වන්න.

02. A හා B යන වස්තු දෙකක් පිළිවෙලින් නැගෙනහිර දිශාවට හා නැගෙනහිරින් $30^0$ ක් දකුණු දිශාවට $u$ හා $2\sqrt{3}V$ ප්‍රවේග වලින් චලිත වේ. ($u > 2\sqrt{3}V$) වේ.
(i) A ට සාපේක්ෂව B ගේ ප්‍රවේගය $\sqrt{u^2 - 6uV + 12V^2}$ බව පෙන්වන්න.
(ii) $V = \dfrac{u}{6}$ විට එහි දිශාව නිර්ණය කරන්න.

(දෙවෙනි පිටුව බලන්න)

M.Tom.

03. ස්කන්ධය $M$ වූ ලොරියක් සමතලා පාරක් දිගේ $ums^{-1}$ නියත ප්‍රවේගයෙන් $H$ $k.w.$ ජවයකින් ගමන් කරයි. පසුව එංජිම $2H$ $k.w.$ ක්‍රියා කරමින් තිරසට $\hat{\alpha}$ ආනත පාරක් දිගේ ඉහළට චලිත වේ. සෑම චලිතයකටම ප්‍රතිරෝධය නියත යැයි සලකා ලොරියේ ඉහළට උපරිම ප්‍රවේගය $\dfrac{2Hu}{(H+Mgu\ Sin\alpha)} ms^{-1}$ බව පෙන්වන්න.

..........................................................................................................................................

04 දිගු $2a$ වන ලුහු අවිතන්‍ය තන්තුවකින් ස්කන්ධය $m$ වන අංශුවක් $A$ අචල ලක්ෂයකට බැඳ තිබේ. අංශුව $A$ ට සිරස්ව පහළින් ඇති විට එය මත $4\sqrt{ag}$ තිරස් ප්‍රවේගයක් දෙනු ලැබේ. යටි අත් සිරස සමඟ $\hat{\theta}$ සාදන විට තන්තුවේ ආතතිය $T = 3mg(2+\cos\theta)$ බව පෙන්වන්න. ඡේදක ආතතිය සොයන්න.

..........................................................................................................................................

05. තිරස් තලයකට $h$ උසක් ඉහළින් පිහිටි $A$ ලක්ෂයක සිට බෝලයක් සිරස්ව පහළට $\sqrt{2gk}$ ප්‍රවේගයෙන් ප්‍රක්ෂේපණය කරයි. $A$ ට වඩා ඉහළින් පිහිටි ලක්ෂයක් දක්වා බෝලය පොලා පනී නම්, එවිට $k > h\left(\dfrac{1}{e^2}-1\right)$ බව පෙන්වන්න. $e$ යනු ප්‍රත්‍යාගති සංගුණකයයි.

..........................................................................................................................................

(තුන්වෙනි පිටුව බලන්න)

06. තිත් ගුණිතය අර්ථ දක්වන්න.

$O$ මූල ලක්ෂය අනුබද්ධයෙන් $A$ හා $B$ ලක්ෂ 2 ක පිහිටුම් දෛශික පිළිවෙලින් $2\underline{i}$ සහ $3\underline{i}+\underline{j}$ යැයි ගනිමු. $C$ යනු $OB$ ට සමාන්තරව $A$ හරහා ඇඳි සරල රේඛාව මත වූ ලක්ෂයකි. $\overline{OC}=(2+3\lambda)\ \underline{i}+\lambda\ \underline{j}$ බව පෙන්වන්න. $\lambda$ අදිශයකි. $OB$ ට $BC$ ලම්බ වන විට $\lambda$ හි අගය සොයන්න.

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

07. $A$ හි දී සෘජු කෝණි වූ $ABC$ ත්‍රිකෝණයක $AB=4a$, $AC=3a$ වන විට $\overrightarrow{AB}$, $\overrightarrow{BC}$, $\overrightarrow{CA}$ පාද දිගේ පිළිවෙලින් 4P, 5P, 6P බල ක්‍රියා කරයි. පද්ධතියේ සම්ප්‍රයුක්තයෙහි විශාලත්වය හා දිශාව සොයන්න. එහි ක්‍රියා රේඛාවට $AB$ පාදය හමුවන ලක්ෂය සොයන්න.

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

08. 


AB = BC = BD වන පරිදි රාමු සැකිල්ල $A$ ලක්ෂයෙන් සුමටව සන්ධි කර P තිරස් බලයක් D ලක්ෂය වෙත යොදා ඇත.

(i) P හි අගය සොයන්න.

(ii) බෝ අංකනය යෙදීමෙන් $BC$ හා CD දඬුවල ප්‍රත්‍යාබල සොයන්න.

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

(හතරවෙනි පිටුව බලන්න)

09. A හා B යනු $P(A \cap B) = \frac{1}{4}$ සහ $P(A) = P\left(A/_{B^1}\right) = \frac{5}{12}$ වන පරිදි වූ සසම්භාවී සිද්ධි 2 කි.

(i) $P(B/A)$ (ii) $P(B)$ (iii) $P(A/B)$ (iv) $P(A \cup B)$ සම්භාවිතා සොයන්න.

A හා B ස්වායත්ත සිද්ධි වේද? පිළිතුර සනාථ කරන්න.

10. පෙට්ටියක නිල් වීදුරු බෝල 3 සහ රතු වීදුරු බෝල 2 ක් ද තවත් පෙට්ටියක නිල් වීදුරු බෝල 2 සහ රතු වීදුරු බෝල 5 ක් ද තිබේ. මේ පෙට්ටි අතුරින් එක් පෙට්ටියකින් සසම්භාවී ලෙස ගත් බෝලය නිල් වීදුරු බෝලයක් විය. එය පළමු පෙට්ටියෙන් ලැබුණු බෝලයක් වීමේ සම්භාවිතාව $^{21}/_{31}$ බව සාධනය කරන්න.

Roy Dissanayake( B.Sc. (Dip. in Ed.)

ද මැසිනොද් විදුහල කඳාන
De Mazenod College - Kandana

10 | S | II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 13 ශ්‍රේණිය
2016 පෙබරවාරි පරීක්ෂණය

# සංයුක්ත ගණිතය II
# Combined Mathematics II

## B කොටස

ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

11. (a) කාලය $t=0$ විට $P$ අංශුවක් $O$ ලක්ෂයක සිට සිරස්ව ඉහළට $V$ ප්‍රවේගයෙන් පක්ෂේපණය කරනුයේ ගුරුත්වය යටතේ චලනය වනසේ ය. එය පථයේ ඉහළම ලක්ෂයට පැමිණි විගස වෙනත් $Q$ අංශුවක් $O$ සිටම සිරස්ව උඩු අතට ගුරුත්වය යටතේ $2V$ ප්‍රවේගයෙන් ප්‍රක්ෂේපණය කරනු ලැබේ. එකම සටහනක $P$ හා $Q$ හි චලිත සඳහා ප්‍රවේග කාල ප්‍රස්ථාර අඳින්න.
එනයින්,

(i) $P$ අංශුවේ උපරිම උස $\dfrac{V^2}{2g}$ බවද,

(ii) $t=\dfrac{5V}{4g}$ වන විට අංශු දෙක හමුවන බවද,

(iii) හමුවන ලක්ෂයේ දී $Q$ හි ප්‍රවේගය $\dfrac{7V}{4}$ බවද පෙන්වන්න.

(iv) $O$ සිට හමුවන ලක්ෂයට උසද සොයන්න.

(b) ගුවන් යානයක නිසල වාතයේ දී ප්‍රවේගය $V\ kmh^{-1}$ වේ. නැගෙනහිරින් $\hat{\alpha}$ උතුරු දිශාවට $U\ kmh^{-1}$ ප්‍රවේගයෙන් සුළඟක් හමා යයි. $AB = a\ km$ වේ. $A$ ට නැගෙනහිරින් $B$ පිහිටා ඇත. $A$ සිට $B$ චලිත වී පසුව නොනවත්වා නැවත $A$ ට ගමන් කරයි. චලිත දෙකටම එකම සටහනක ප්‍රවේග ත්‍රිකෝණ නිර්මාණය කර එමගින් $A$ සිට $B$ ට චලිත වීමට යානය ගන්නා කාලය පැය $\dfrac{a}{(V^2-u^2)}\left\{\sqrt{V^2-u^2 Sin^2\alpha}-u\,Cos\,\alpha\right\}$ බව පෙන්වන්න. නැවත $A$ ට චලිත වීමට කාලය සොයන්න.

12. (a) පොලව මත $O$ ලක්ෂයේ සිට තිරසට $\hat{\alpha}$ කෝණයකින් ආනතව අංශුවක් ගුරුත්වය යටතේ $U$ ප්‍රවේගයෙන් $O$ සිට $a$ දුරක් ඇතින් පිහිටි තාප්පයකට ලම්බ තලයක ප්‍රක්ෂේපණය කෙරේ. $O$ සිට $x$ තිරස් දුරකින් ඇති විට අංශුව $y$ උසකින් පිහිටයි නම් එහි කාටීසියානු සමීකරණය $gx^2 \sec\alpha = 2U^2(x\sin\alpha - y\cos\alpha)$ බව පෙන්වන්න.

අංශුව තාප්පය උඩින් යමතමින් ගොස් තාප්පයේ සිට $d$ දුරක් ඇතින් පිහිටි ලක්ෂයකදී පොළොව මත පතිත වේ නම් තාප්පයේ උස $\left(\frac{ad}{a+d}\right)\tan\hat{\alpha}$ බව පෙන්වන්න.

(b) ස්කන්ධය 1100 $kg$ වූ වාහනයකට 44 $kw$ උපරිම ජවයක් ඇත. චලිතයට ප්‍රතිරෝධය 2200 $N$ වේ.

(i) වාහනය සම බිමේ ගමන් කරන විට එහි උපරිම ප්‍රවේගය 20 $ms^{-1}$ බව පෙන්වන්න.

(ii) වාහනය 20 : 1 ආනතියක් ඇති බෑවුමක පහළට ගමන් කරන්නේ උපරිම ජවයෙන් 50% යොදා ගනිමින් නම්, එවිට වාහනයේ උපරිම ප්‍රවේගය $40/3$ $ms^{-1}$ බව පෙන්වන්න.

---

13. (a)




ස්කන්ධය $M$ වන සුමට කුඤ්ඤයක් සුමට තිරස් කලයක් මත තබා සටහනේ පරිදි ස්කන්ධය $2m$ සහ $m$ වන අංශු 2 ක් සැහැල්ලු තන්තුවකින් සම්බන්ධ කර ඇත.

පද්ධතිය නිසලව තබා මුදා හරිනු ලැබේ.

(i) කුඤ්ඤයේ ත්වරණය $\frac{2mg\cos\alpha\ (2\sin\alpha - 1)}{[3M + m(5 + 4\sin^2\alpha)]}$ බව පෙන්වන්න.

(ii) 2m අංශුව ආනත පෘෂ්ඨය මත $d$ දුරක් චලිත වන කාලය තුළ කුඤ්ඤය තිරස් තලය මත $S$ දුරක් චලිත වේ නම් එවිට $S = \frac{2md\cos\alpha}{(M + 3m)}$ බවද සාධනය කරන්න.

(b) $10ms^{-1}$ ප්‍රවේගයෙන් චලනය වන ස්කන්ධය 1 $Kg$ වන $A$ ගෝලයක් එම දිශාවටම $8ms^{-1}$ ප්‍රවේගයෙන් චලනය වන 2.5 $Kg$ ස්කන්ධය ඇත $B$ ගෝලයක් සමඟ සරලව ගැටේ. ගැටුමට පසු $A$ හා $B$ හි ප්‍රවේග පිළිවෙලින් $u$ හා $v$ නම් ප්‍රත්‍යාගති සංගුණකය $e$ වන විට $u = \frac{10}{7}(6-e)$ සහ $v = \frac{4}{7}(5+e)$ බව පෙන්වන්න.

$0 \le e \le 1$ වන විට $\frac{50}{7} \le u \le \frac{60}{7}$ බව අපෝහණය කරන්න.

$e = \frac{1}{2}$ විට ගැටුමින් සිදුවන ආවේගය සොයන්න.

14. (a) කේන්ද්‍රය $O$ සහ අභ්‍යන්තර අරය $a$ වූ අචල සුමට කුහර ගෝලයක සුමට අන්තඃපෘෂ්ඨය මත චලනය වීමට නිදහස ඇති $P$ අංශුවක් එම පෘෂ්ඨයේ පහත්ම $A$ ලක්ෂයේ තබා ඇත. ඊළඟට අංශුව ආරම්භක $\sqrt{\lambda ga}$ වේගයෙන් තිරස්ව ප්‍රක්ෂේපණය කරනු ලැබේ. මෙහි $\lambda > 0$ වේ. අංශුව පෘෂ්ඨය සමඟ ස්පර්ශව තිබෙන මොහොතේ $OP$ හැරෙන කෝණය $\hat{\theta}$ වන විට $a\left(\frac{d\theta}{dt}\right)^2 = g(\lambda - 2 + 2\cos\ \theta)$ බව සාධනය කර අංශුව මත ප්‍රතික්‍රියාව $mg(\lambda - 2 + 3\ \cos\ \theta)$ බවද පෙන්වන්න.

$2 < \lambda < 5$ වේ නම් $P$ අංශුව ගෝල පෘෂ්ඨය හැර යන ප්‍රවේගය $\sqrt{\frac{(\lambda - 2)ga}{3}}$ බව සාධනය කරන්න.

තවද $P$ අංශුව පෘෂ්ඨයෙන් ඉවත් වන්නේ $O$ හි මට්ටමෙන් $\frac{a}{2}$ උසක තිබිය දී නම්, එවිට

(i) $\lambda = \frac{7}{2}$ බවත්,

(ii) අනතුරුව සිදුවන නිදහස් චලිතයේ දී $P$ හි පෙත $A$ හරහා යන බවත් පෙන්වන්න.

---

15. (a) O, A හා B ඒක රේඛීය නොවන ලක්ෂ 3 කි. $\overline{OA} = \underline{a}$ හා $\overline{OB} = \underline{b}$ වේ. $C$ යනු $\overline{OC} = \frac{(\underline{a} + 2\underline{b})}{3}$ වේ,

බව පෙන්වන්න. $OP$ රේඛාව $R$ හිදී $AB$ හමුවෙයි නම්, $\overrightarrow{RB} = \underline{b} - k(2\underline{a} + 5\underline{b})$ බව පෙන්වන්න.

මෙහි k යනු අදිශයකි. තවද $\overline{RB} = \lambda\ \overline{AB}$ ලෙස ගෙන $\frac{RB}{AB} = \frac{2}{7}$ බව සාධනය කරන්න.

(b)




සටහනේ පරිදි අචලව සවිකර ඇති කුහර අර්ධ ගෝලයක් ඇතුළත ස්කන්ධය $m$ වන $A$ යන අංශුවක් තබා ඒ මත $P$ තිරස් බලයක් යොදා අංශුව සමතුලිතව තබා ඇත.

(i) අර්ධ ගෝලය ඇතුළත පෘෂ්ඨය සුමට නම්, $Tan\ \theta = \frac{P}{mg}$ බව පෙන්වන්න.

(ii) අර්ධ ගෝලයේ ඇතුළත රළු සහ එහි ඝර්ෂණ සංගුණකය $\mu$ නම් සීමාකාරී සමතුලිත අවස්ථාවේ දී අංශුව ඇති විට සහ අංශුව පහළට ලිස්සීමට ආසන්න නම්,

$Tan\ \theta = \frac{P + \mu\ mg}{mg - \mu P}$ බවද පෙන්වන්න.

16 (a) දිග $2a$ සහ බර $w$ බැගින් වන ඒකාකාර $AB$ , $BC$ දඬු 2 ක් $B$ හිදී සුමටව සන්ධි කර $A$ හා $C$ කෙළවර සුමට තිරස් තලයක් මත තබා $ABC$ සිරස්ව සමතුලිතව ඇත්තේ $A$ හා $BC$ හි මධ්‍ය ලක්ෂ මත $D$ ලක්ෂය යා කරන සැහැල්ලු තන්තුවක් මගිනි. $A\hat{B}C = 2\hat{\alpha}$ වේ. $A$ හා $C$ හි අභිලම්බ ප්‍රතික්‍රියා $w$ බව පෙන්වන්න.

(i) $B$ සුමට සන්ධියේ ප්‍රතික්‍රියාව $\frac{w}{4}\sqrt{1+9\ Tan^2\alpha}$ බව පෙන්වන්න.

(ii) එය තිරස සමඟ $\hat{\theta}$ සාදයි නම් $\hat{\theta} = Tan^{-1}\left(\frac{1}{3}Tan\ \alpha\right)$ බවද,

(iii) තන්තුවේ ආතතිය $T$ නම් $T = \frac{w\sqrt{1+8\ Sin^2\alpha}}{4\ Cos\ \alpha}$ බවද පෙන්වන්න.

(b)




සමාන දිග ඇති සැහැල්ලු දඬු 5 කින් සමන්විත රාමු සැකිල්ලක් $A$ හිදී සුමටව අසව් කර $C$ ලක්ෂ යෙන් $W$ භාරයක් එල්ලා $AD$ පාදයට ලම්බ වන පරිදි $D$ මත $P$ බලයක් යොදා පද්ධතිය සමතුලිතව තබා ඇත.

(i) P හි විශාලත්වය $\frac{3W}{2}$ බව ද,

(ii) A හි තිරස් හා සිරස් සංරචක බල සොයා එමගින් සම්ප්‍රයුක්ත බලය $\sqrt{7}\,W/2$ බවද පෙන්වන්න.

(iii) C සන්ධිය සඳහා පමණක් ප්‍රත්‍යාබල සටහනක් ඇඳ $BC$ හා $DC$ දඬුවල ප්‍රත්‍යාබල සොයන්න.

(iv) ප්‍රත්‍යාබල සටහනක් <u>නොමැතිව</u> $A$ හි සමතුලිතතාවය මගින් $AB$ හා $AD$ දඬුවල ප්‍රත්‍යාබල සොයන්න.

---

17. (a) $A$ හා $B$ සිද්ධි ස්වායත්ත නම් එවිට A හා $B^1$ ද, $A^1$ හා $B^1$ සිද්ධිද ස්වායත්ත වන බව සාධනය කරන්න. .

(b) $A$ හා $B$ යනු $S$ නියැදි අවකාශයේ ඕනෑම සිද්ධි 2 ක් ලෙස ගනිමු.
එවිට $P(A \cap B^1) = P(A) - P(A \cap B)$
$P(A \cup B) = P(A) + P(B) - P(A \cap B)$ බව පෙන්වන්න.

(C) $A$ හා $B$ අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර සිද්ධි නම්

(i) $P\left(A/B^1\right) = \frac{P(A)}{1-P(B)}$ (ii) $P\left[A/(A \cup B)\right] = \frac{P(A)}{P(A)+P(B)}$ බවද පෙන්වන්න.

(d) ජාතික ක්‍රිකට් ඇකඩමියට සමාගම් 3 කින් ක්‍රිකට් බෝල පෙට්ටි 3 ක් ගෙන ඇත. $A$ සමාගමේ පෙට්ටියක බෝල 12 ක් ඇත. එහි පළුදු වූ බෝල 2ක් ඇත. $B$ සමාගමේ පෙට්ටියක බෝල 12 න් 3 ක් පළුදු වී ඇත. $C$ සමාගමේ පෙට්ටියක බෝල 6 ක් ඇති අතර 2 ක් පළුදු වී ඇත. ක්‍රිකට් විනිසුරු සසම්භාවී ලෙස ගත් බෝලය පළුදු එකක් වීමේ සම්භාවිතාව $1/4$ බව පෙන්වන්න. තෝරාගත් බෝලය පළුදු එකක් නම් එය සිදුවීමට වඩාත්ම ඉඩ ඇත්තේ කුමන පෙට්ටියෙන් ගත් බෝලයකින්ද යන්න නිගමනය කරන්න.

*Roy Dissanayake B.Sc. (Dip. in Ed.)*